# ගොඩින් මඩින්

කරපුටුගල කෘෂිකාර්මික පලද වර්ධන කමිටුවේ මංගල රැස්වීම 1974 අප්‍රියෙල් මස 26 වෙනි දින කිරින්ද පුහුල්වැල්ල ගම් සභා කාර්යාලයේදී පැවැත්වුනු බව අප වෙත දන්වා එවා තිබේ. මාතර ග්‍රාමීය ආයතන හා පලදා වර්ධන නිති සහකාර අධ්‍යක්ෂ, කඹුරුපිටිය උප දිසාපති, පලද වර්ධන කමිටු බල ප්‍රදේශයට අයත් ගොවි කාරක සභාවල සාමාජිකයින් ඇතුළු තවත් අය මෙම රැස්වීමට සහභාගී වී තිබේ. කෘෂි සේවා මධ්‍යස්ථානයක් ඉක්මනින් ලබා දීමට කටයුතු කරන බව උප දිසාපති විසින් දන්වන ලදී. කොම්පෝස්ට් පොහොර භාවිතය වැඩි කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස පලද වර්ධන නිති සහකාර අධ්‍යක්ෂ මෙම රැස්වීමේදී ඉල්ලා සිටියේය. රෝද දෙකේ ට්‍රැක්ටර් හතරක් පලදා වර්ධන කමිටුවට ලබා ගැනීමටත්, ජල ගැලීම නිසා වගා පාළු වූ ගොවීන්ගේ වගා ණය කපා හැරීමට ඉල්ලා සිටීමටත් මෙම රැස්වීමේදී තීරණය කරන ලදී.

❀ ❀ ❀

''නිමල් සෙවණ''
අංක 1276/ඒ
පදවි-ශ්‍රීපුර.

අධ්‍යක්ෂකතුමා,
''ගොවි ජනතාව'' - 33, එළිබැන්ක් පාර,
කොළඹ 5.

වගා සටනේ සෙබලුන් අතර වගකීමක් ඇතිව සටනට වැදී ඇති පදවිය ජනපදයේ ගොවි මහතුන් සමග අප කමිටුවේ සහෝදර සාමාජික පිරිස වෙනුවෙන් ''ගොවි ජනතාව'' සඟරාවට සුභ අනාගතයක් උදා වේවායි ආසිරි පතමි.

අපේ වගා සටන අඩ පන කරන ඊට අකුල් හෙලන කඩා කප්පල්කාරී නිලධාරීන්ට පහර දීමට ''ගොවි ජනතාව'' සඟරාව අමරනීය අසිපතක් ලෙසට මුවහත් කර සූදනම් කරන මෙන් ඉල්ලා සිටිමි.

අ: ක:/ඩී. ඒ. කේ. ගුණරත්න
සභාපති
කෘෂිකර්ම පලද වර්ධන කමිටුව

මාතලේ කොහොන්සිය පත්තුවේ තැන්න කෘෂිකාර්මික පලද වර්ධන කමිටුව ගැන පහත සඳහන් විස්තර අපට ලැබී තිබේ.

මෙම කමිටුවේ මංගල රැස්වීම 1973 මාර්තු මස 22 වන දින පවත්වන ලදී. පලද වර්ධන කමිටුවේ පරමාර්ථය ගොවීන්ට අවබෝධ කර දීම සඳහාත්, වගා කටයුතු පුළුල් කර දීම සඳහාත් ප්‍රචාරක රැස්වීම් දෙකක් 1973 අප්‍රියෙල් 1 වන සහ 5 වන දිනවල පලද වර්ධන කමිටුවේ අනුග්‍රහයෙන් පැවැත්විනි. මෙම රැස්වීම් වලින් පසු වල් වැදී තිබුණු ඉඩම් හෙළි කර මයියොක්කා, බතල, කුරහන් සහ වෙනත් භෝග වර්ග වවා තිබේ. රජයේ සහ වෙනත් නිලධාරීන්ගේත්, ගොවි කාරක සභාවලත් ආධාරය ඇතිව 1973 ජූලි 28 සහ 29 යන දිනවල කෘෂි සේවා මධ්‍යස්ථානයේ පවත්වන ලද කෘෂිකර්ම ප්‍රදර්ශනය ඉතා සාර්ථක එකක් විය. ප්‍රදර්ශනයට සම්බන්ධ කර පවත්වන ලද වගා තරඟයට ගොවි මහතුන් 336 දෙනෙක් සහ පාසැල් 3 ක් සහභාගි වූහ. ජයග්‍රාහකයින්ට ත්‍යාග වශයෙන් ගොවි ආම්පන්න බෙද දීම විශේෂ ලක්ෂණයක් විය.

කෘෂි සේවා මධ්‍යස්ථාන භූමියේ දැනට මයියොක්කා, බතල, මිරිස් සහ ඉදල් ඉරිඟු යනාදී භෝග වවා තිබේ. මධ්‍යස්ථානයට අයිති මිරිස් පැල තවානෙන් ගොවීන්ට පැල විකුණා රු. 300/- ක පමණ ලාභයක් ලැබී ඇත. ගොවීන් අතර බීජ වර්ග බෙද හැරීමටත් කටයුතු කරගෙන යනු ලැබේ. එමෙන්ම ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා ඉසින යන්ත්‍රයක් ද මධ්‍යස්ථානය සතුව ඇත. මෙම කමිටුව විසින් මේ දක්වා ගොවි හැඳුනුම් පත් 225 ක් පමණ නිකුත් කර තිබේ. පලද වර්ධන කමිටුවේ දැඩි උනන්දුව නිසා මෙම යල් කන්නයේ කුඹුරු අක්කර 550 ක පමණ ගොයම් පැල සිටුවීමට හැකි විය. තැන්න - තිබ්බටුවාව-ඕවිල්ල ගොවි කාරක සභා බල ප්‍රදේශය තුළ රජයේ ආධාර ඇතිව අමුණු තුනක් ඉදි කර ඇති අතර තවත් එවැනි අමුණු කිහිපයක වැඩ කටයුතු කරගෙන යනු ලැබේ. තවද, මෙම පලද වර්ධන කමිටු බල ප්‍රදේශය තුළ කොම්පෝස්ට් පෝර සෑදීම සඳහා පෝර වලවල් 223 ක් පමණ පිළියෙල කර ඇත.